# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1777/32 – 2012 සැප්තැම්බර් 26 වැනි බදාදා – 2012.09.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහ පත්තුව සුළු කොට්ඨාසයේ, කිරිගම්පමුණුව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/එච්එම්ජී/2010/214 සහ 2010.07.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් සඳහන් කලුවල කුඹුර නමැති ප්‍රමාණයෙන් හෙක්. 0.0276 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

**කැබලි අංක 1 – කලුවල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0276**

උතුරට: බී. ඩී. නන්දාවතී සහ තවත් අය හිමිකම් කියන කලුවල කුඹුර; නැගෙනහිරට: ඇළ; දකුණට: බී. ඩී. නන්දාවතී සහ තවත් අය හිමිකම් කියන කලුවල කුඹුර; බටහිරට: දක්ෂිණ අධිවේගී මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2009/එච්ඩබ්/එස්ටීඩීපී/ජේබීඅයිසී/141.
ප්‍රා.ලේ. අංකය: 3/3/2/57.
2012 අගෝස්තු මස 09 වැනි දින,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 – 522

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැලෑඳ ගමේ පිහිටි, කළුතර කොට්ඨාස භාර මැනුම් අධිකාරී විසින් 2012.04.03 දිනැතිව සකස් කරන ඇති අංක කේජ්/පීඑල්එන්/12/78 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ලීමාවලදෙනිය නමැති ප්‍රමාණයෙන් හෙක්. 0.4983 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

උතුරට: ආරියසේන ලයනල් ගුනතිලක හිමිකම් කියන ලීමාවලදෙනිය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන අස්වැලිය වත්ත; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන අස්වැලිය වත්ත සහ කුකුළේ ගඟ නිවාඩු නිකේතනය හිමිකම් කියන අස්වැලිය වත්ත; දකුණට: කුකුළේ ගඟ නිවාඩු නිකේතනය හිමිකම් කියන අස්වැලිය වත්ත; බටහිරට: කුකුළේ ගඟ නිවාඩු නිකේතනය හිමිකම් කියන අස්වැලිය වත්ත සහ ආරියසේන ලයනල් ගුනතිලක හිමිකම් කියන ලීමාවලදෙනිය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/4/2011/ඩී/363.
2012 අගෝස්තු මස 16 වැනි දින,
අංක 1200/06, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 – 530

1A – G 16669 – 375 (2012/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.